## 140 - රැගෙනෙමි මා සතු

රැගෙනෙමි මා සතු සියලු දේ
පඬුරු කරන්නට මේ යාගික මොහොතේ

මගෙ මුළු දිවිය ද, මගෙ දුක් කඳුළු ද
මගෙ ශ්‍රම ශක්තිය මා සතු ජීවය
පඬුරු කරමින් ආසිරි පතමින්
පිළිගන්නෙමි දැන් බැති අදරින්

මගෙ ආදර මව් බිම සිරි ලක් බිම
එහි වසනා සැම වැසියන් සමගින
පුදනෙමි ඔබහට මෙදින සැමමා
පිළිගන්නකෝ දැන් ඔබට පුදම්

මගෙ මව් පියෝ හා මගෙ නෑ සියලුන්
මගෙ හිත මිතුරන්, මගෙ හැම සතුරන්
පඬුරක් කරමින් ආසිරි පතමින්
පිළිගන්වමි දැන් සුහඳ සිතින්